Maahanmuuttovirasto
Migrationsverket
Finnish Immigration Service

Euroopan unionin osarahoittama

# රැකවරණ ඉල්ලීමේ සම්මුඛ පරීක්ෂණය

ඔබව ෆින්ලන්ත ආගමන සේවය විසින් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා ඇත. කරුණාකර මෙම උපදෙස් පත්‍රිකාව හොඳින් කියවන්න. එහි සම්මුඛ පරීක්ෂණයේදී ඔබට ඇති අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳ තොරතුරු අඩංගු වේ. මෙම උපදෙස් පිළිබඳ ඔබට කිසියම් ප්‍රශ්නයක් තිබේ නම්, සම්මුඛ පරීක්ෂණය ආරම්භයේදී ෆින්ලන්ත ආගමන සේවයේ නිලධාරියාගෙන් ඒවා විමසිය හැකිය.

## සරණාගතභාවය (ජාත්‍යන්තර ආරක්ෂාව) සඳහා වන සම්මුඛ පරීක්ෂණය යනු කුමක්ද?



- සරණාගතභාවය සඳහා වන සම්මුඛ පරීක්ෂණය යනු ෆින්ලන්ත ආගමන සේවයේ නිලධාරියෙකු සමඟ පවත්වන නිල හමුවකි. එහිදී ඔබ ෆින්ලන්තයෙන් ජාත්‍යන්තර ආරක්ෂාව ඉල්ලා සිටින හේතු සහ ඔබට ඔබගේ මව් රටට ආපසු යා නොහැකි හේතු පිළිබඳව විස්තරාත්මකව පැහැදිලි කළ යුතුය.
- මෙම සම්මුඛ පරීක්ෂණයේදී සාකච්ඡා කරන්නේ ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා කළ අයදුම්පත පිළිබඳව පමණි. ඔබට ෆින්ලන්තයේ පවුලේ සාමාජිකයන් සිටී නම්, පවුල් සම්බන්ධතාවය මත පදනම් වූ නේවාසික බලපත්‍රයක් සඳහා අයදුම් කළ හැකිය. ඒ සඳහා ඔබ වෙනම, ගාස්තු අය කරන නේවාසික බලපත්‍ර අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

## සම්මුඛ පරීක්ෂණය කොහේදී, කවදා සහ කෙසේ පැවැත්වේද?

- මෙම උපදෙස් සමඟ ඔබට සම්මුඛ පරීක්ෂණයට කැඳවීමක් ලැබී ඇත. එහි ඔබගේ සම්මුඛ පරීක්ෂණය කොතැන, කවදා සහ කෙසේ පැවැත්වෙන්නේද යන්න සඳහන් කර ඇත
- සම්මුඛ පරීක්ෂණය ශබ්ද ලෙස පටිගත කරනු ලබන අතර, ඔබ කැමති නම් එම පටිගත කිරීමේ පිටපතක් ඉල්ලා ගත හැක. මෙම පටිගත කිරීම සිදු කරන්නේ ඇති විය හැකි අපැහැදිලි තත්ත්වයන් පැහැදිලි කිරීම සඳහා වන අතර, ෆින්ලන්ත ආගමන සේවය එය බාහිර පාර්ශ්වයන්ට ලබා නොදේ.
- සම්මුඛ පරීක්ෂණ කාමරයේ වීඩියෝ පටිගත කරන නිරීක්ෂණ කැමරාවක් තිබිය හැක.
- සම්මුඛ පරීක්ෂණය පිළිබඳ වාර්තාවක් සකස් කරනු ලැබේ.
- ඔබ සම්මුඛ පරීක්ෂණයේදී පවසන සියලු දේ රහසිගතව සලකනු ලැබේ. ඔබ පැවසූ කරුණු නීතිය අනුව තොරතුරු ලබාගැනීමේ අයිතිය ඇති, ඔබගේ නඩුව සම්බන්ධයෙන් අවශ්‍ය වන බලධාරීන්ට හැර වෙනත් කිසිවෙකුට හෙළි නොකෙරේ.

- ඔබගේ සම්මුඛ පරීක්ෂණය වීඩියෝ සම්බන්ධතාවක් මගින් පැවැත්වෙන්නේ නම්, ඒ පිළිබඳව කැඳවීමේ ලිපියේ සඳහන් වේ. වීඩියෝ සම්බන්ධතාවයෙන් පැවැත්වෙන හමුවීම් පිළිබඳ වැඩි විස්තර ෆින්ලන්ත ආගමන සේවයේ වෙබ් අඩවියෙන් ලබාගත හැක: migri.fi/turvapaikanhakijan-asiointi.
- ඔබට සාධාරණ සහ පිළිගත හැකි හේතුවක් නොමැතිව සම්මුඛ පරීක්ෂණයේ දිනය වෙනස් කළ නොහැක. ඔබ සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනයේ අසනීප වුවහොත්, ඒ පිළිබඳව වහාම ෆින්ලන්ත ආගමන සේවයට දැනුම් දිය යුතුය. අවශ්‍ය නම්, මේ සඳහා ඔබට පිළිගැනීමේ මධ්‍යස්ථානයෙන් සහාය ලබා ගත හැක. ඔබ අසනීප වූ බවට සාධාරණ හේතුවක් ඉදිරිපත් කළ යුතු අතර, හෝ පිළිගැනීමේ මධ්‍යස්ථානයේ හෙද නිලධාරියෙකුගේ හෝ වෛද්‍යවරයෙකුගේ සහතිකයක්/වාර්තාවක් හැකි ඉක්මනින්, නැතහොත් සම්මුඛ පරීක්ෂණ දිනයෙන් සතියක් ඇතුළත (දින 7ක් තුළ) ෆින්ලන්ත ආගමන සේවයට ලබා දිය යුතුය. ඔබ සාධාරණ හේතුවක් නොමැතිව සරණාගතභාවය සම්බන්ධ සම්මුඛ පරීක්ෂණයට නොපැමිණියහොත්, ඔබගේ අයදුම්පත වක්‍රව ආපසු ලබාගත් එකක් ලෙස සලකා, එම අයදුම්පත සම්බන්ධ ක්‍රියාවලිය අවසන් කරනු ලැබේ.

## සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන්නේ කවුරුන්ද?

සම්මුඛ පරීක්ෂණයට පැමිණිය හැක්කේ එයට කැඳවා ඇති පුද්ගලයින් සහ ෆින්ලන්ත ආගමන සේවය සමඟ පෙර එකඟ කරගත් අනෙකුත් පුද්ගලයින් පමණි. සම්මුඛ පරීක්ෂණයේදී ෆින්ලන්ත ආගමන සේවයේ නිලධාරියෙකු, එනම් සම්මුඛ පරීක්ෂක , සහ තත්ත්වය අනුව භාෂා පරිවර්තකයෙකු , නීතිමය සහායකයෙකු , නියෝජිතයෙකු , භාරකරු/නීතිමය අධීක්ෂකයෙකු හෝ සහායක පුද්ගලයෙකු පැමිණ සිටිය හැක. ඔබ සම්මුඛ පරීක්ෂණයට සහායක පුද්ගලයෙකු සහභාගී කරවීමට ඉල්ලීමක් කර තිබේ නම්, සහ ඔහුට හෝ ඇයට ෆින්ලන්ත ආගමන සේවයෙන් සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීමට අවසර ලබා දී ඇත්නම්, එම පුද්ගලයාද පැමිණ සිටිය හැක. සහභාගීවන්නන්ගේ භූමිකා පිළිබඳ වැඩි විස්තර සඳහා ෆින්ලන්ත ආගමන සේවයේ වෙබ් අඩවිය වන **migri.fi/turvapaikanhakijan-asiointi** වෙත පිවිසෙන්න.

## සම්මුඛ පරීක්ෂණය අතරතුර මට හිමි අයිතිවාසිකම් මොනවාද?

- සම්මුඛ පරීක්ෂණයේදී ඔබට නීතිමය සහායකයෙකු භාවිතා කිරීමේ අයිතිය ඇත. සහායකයා තමන්ගේ වෘත්තීය විනිශ්චය අනුව සම්මුඛ පරීක්ෂණයට සහභාගී වේ.
- ඔබ වැඩිහිටි සරණාගතභාවය අයදුම්කරුවෙකු නම්, සහායකයෙකු සොයා ගැනීම ඔබේම වගකීමකි. ඔබ සම්මුඛ පරීක්ෂණය සඳහා සහායකයෙකු ලබා නොගන්නේ නම්, සම්මුඛ පරීක්ෂණය සහායකයෙකු නොමැතිව පවත්වනු ලැබේ.
- ඔබ භාරකරුවෙකු නොමැති බාලවයස්කරුවෙකු නම්, ඔබගේ නියෝජිතයා සෑම විටම සම්මුඛ පරීක්ෂණයේදී පැමිණ සිටී. අවශ්‍ය නම්, සම්මුඛ පරීක්ෂණය සඳහා සහායකයෙකු ලබා ගැනීමේ කටයුතු ඔබගේ නියෝජිතයා විසින් සිදු කරයි. ඔබට නියෝජිතයෙකු නොමැති නම්, ෆින්ලන්තයේ සිටින ඔබගේ භාරකරු සම්මුඛ පරීක්ෂණයේදී පැමිණ සිටී.

- සම්මුඛ පරීක්ෂණයේදී භාෂා පරිවර්තකයෙකු සිටී. පරිවර්තකයාගේ කාර්යය වන්නේ සම්මුඛ පරීක්ෂණයේදී කියවෙන සියලු දේ මධ්‍යස්ථව හා නිවැරදිව පරිවර්තනය කිරීමයි. පරිවර්තකයා ස්ථානයේම සිටිය හැකි අතර, නැතහොත් දුරකථනයෙන් හෝ වීඩියෝ සම්බන්ධතාවයක් හරහා පරිවර්තනය කළ හැක.
- පරිවර්තකයා හෝ සම්මුඛ පරීක්ෂකයා කාන්තාවක් හෝ පුරුෂයෙකු විය යුතු බවට ඔබට සාධාරණ හේතුවක් මත ඉල්ලීමක් තිබේ නම්, ඒ පිළිබඳව සම්මුඛ පරීක්ෂණයට පෙර ප්‍රමාණවත් කාලයකින් පිළිගැනීමේ මධ්‍යස්ථානයේ සේවකයෙකුට දැනුම් දෙන්න. පිළිගැනීමේ මධ්‍යස්ථානය ඔබගේ ඉල්ලීම ෆින්ලන්ත ආගමන සේවය වෙත යොමු කරනු ඇත. එම හේතුව සාධාරණද යන්න ආගමන සේවය විසින් ඇගයීමට ලක් කරයි. ඔබ රැඳවුම් මධ්‍යස්ථානයක හෝ වෙනත් ආයතනයක සිටී නම්, ඔබගේ නවාතැන් ස්ථානයේ සේවකයෙකුට මේ පිළිබඳව දැනුම් දෙන්න. ඔබ භාරකරුවෙකු නොමැති බාලවයස්කරුවෙකු නම්, ඔබගේ නියෝජිතයාගෙන් සහාය ඉල්ලන්න.
- සම්මුඛ පරීක්ෂකයා සහ සම්මුඛ පරීක්ෂණයේදී සිටින අනෙකුත් සියලු දෙනා රහස්‍යභාවය රැකීමේ වගකීමට යටත් වේ. එනම්, ඔවුන් සම්මුඛ පරීක්ෂණයේදී අසා දැනගත් කිසිවක් බාහිර පුද්ගලයෙකුට පැවසීමට අවසර නැත. කෙසේ වෙතත්, ඔබ සම්මුඛ පරීක්ෂණයේදී පවසන කරුණු ඔබගේ පවුලේ සාමාජිකයෙකුගේ අයදුම්පත සම්බන්ධ තීරණයට බලපෑම් කළ හැකිය. එවැනි අවස්ථාවලදී, එම තොරතුරු පවුලේ සාමාජිකයාගේ නඩුව සලකා බැලීමේදී සැලකිල්ලට ගනු ලැබේ. එහෙත්, ඔබ පැවසූ කරුණු හෙළි කිරීමෙන් ඔබට හෝ ඔබගේ සමීපතමයෙකුට අනතුරක් හෝ හානියක් සිදුවිය හැකි නම්, එම තොරතුරු පවුලේ සාමාජිකයාගෙන් පවා රහසිගතව තබා ගත හැකිය. මේ පිළිබඳව ඔබගේ අදහස සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රකාශ කළ හැක.
- ඔබ සම්බන්ධ ලේඛන සහ ලිපිගොනු මූලික වශයෙන් රහසිගත ලේඛන ලෙස සලකනු ලැබේ.
- ඔබ භාරකරුවෙකු නොමැති බාලවයස්කරුවෙකු නම්, ෆින්ලන්ත ආගමන සේවයට ඔබගේ දෙමාපියන් හෝ ඔබගේ සැබෑ භාරකරු සොයා බැලීමේ හැකියාව ඇත. "සැබෑ භාරකරු" යන්නෙන් අදහස් වන්නේ ඔබගේ මව්රටේදී ඔබව රැකබලා ගත් පුද්ගලයාය. සොයා බැලීම සඳහා භාවිතා කරන්නේ ඒ සඳහා අත්‍යවශ්‍ය තොරතුරු පමණි. මෙම ක්‍රියාවලිය ඔබට හෝ ඔබගේ සමීපතමයින්ට කිසිදු හානියක් හෝ අහිතකර බලපෑමක් නොවන ආකාරයෙන් සිදු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී, මෙම සොයා බැලීම සම්බන්ධයෙන් ඔබගේ අදහස සහ එයට උපකාරී විය හැකි තොරතුරු පිළිබඳව ෆින්ලන්ත ආගමන සේවය ඔබෙන් විමසනු ඇත.

## සම්මුඛ පරීක්ෂණයේදී මට ඇති වගකීම් මොනවාද?

- ඔබ සහයෝගයෙන් කටයුතු කිරීමටත් සත්‍යය පැවසීමටත් බැඳී සිටී.
- ඔබ ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම් කළ සියලු හේතු පිළිබඳව තොරතුරු ලබා දීමටත් ඒවා පැහැදිලි කිරීමටත් වගකීමක් ඇත. ප්‍රශ්නවලට ඔබට හැකි තරම් නිවැරදිව සහ විස්තරාත්මකව පිළිතුරු දෙන්න.
    - ඔබ සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රශ්නවලට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, එම හේතුවෙන් ඔබගේ සරණාගතභාවය සඳහා වන පදනම් පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත නොහැකි වුවහොත්, ඔබගේ අයදුම්පත වක්‍රව ආපසු ලබාගත් එකක් ලෙස සලකා එහි කටයුතු අවසන් කරනු ලැබේ.

- ඔබ සත්‍යය නොපවසන්නේ නම්, එය ඔබගේ අයදුම්පතට අහිතකර ලෙස බලපෑ හැකිය. එබැවින් සත්‍යය පවසන්න. ඔබගේ අයදුම්පත සම්බන්ධයෙන් වැදගත් වන කිසිදු තොරතුරක් සඟවා නොතබන්න.
- වැරදි තොරතුරු ලබා දීම හෝ නිවැරදි තොරතුරු සඟවා තැබීම, පසුව ඔබට දැනටමත් ලබා දී ඇති අවසරයක් අවලංගු කිරීමට හේතු විය හැකි අතර, ඔබගේ අනෙකුත් කටයුතු සහ අයදුම්පත් සම්බන්ධ ක්‍රියාවලියද සංකීර්ණ කළ හැකි බව සලකන්න.
- සම්මුඛ පරීක්ෂකයා ඔබගේ අයදුම්පත සඳහා වන හේතු පැහැදිලි කිරීමට ඔබට උපකාර කරනු ඇති අතර, ඒ සඳහා ප්‍රශ්න අසමින් ඔබට මඟ පෙන්වනු ඇත. මෙයට සංවේදී හෝ කතා කිරීමට අපහසු කරුණු ද ඇතුළත් විය හැකිය. එවැනි අපහසු කරුණු පිළිබඳව පවා කතා කිරීම ඔබගේම යහපත සඳහා වැදගත් වේ, මන්ද ඒවා ඔබගේ අයදුම්පත සම්බන්ධයෙන් තීරණාත්මක වැදගත්කමක් දරන්නට පුළුවන.
  - සමහර කරුණු ගැන කතා කිරීම ඔබට අපහසු නම්, ඒ බව සම්මුඛ පරීක්ෂකයාට පැවසිය හැක. කෙසේ වෙතත්, ඔබගේ අයදුම්පතට අදාළ සියලු කරුණු පිළිබඳව පැවසීම ඉතා වැදගත්ය, මන්ද තීරණය ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයේදී ඔබ ලබා දෙන තොරතුරු මත පදනම්වය.
- සම්මුඛ පරීක්ෂකයා ඔබගේ ප්‍රකාශයේ අපැහැදිලි කරුණු හෝ පරස්පරතා හඳුනා ගන්නේ නම්, ඒවා පැහැදිලි කිරීමට ඔබට අවස්ථාව ලබා දෙනු ලැබේ.
- සම්මුඛ පරීක්ෂණයේදී ඔබගේ පුද්ගලික තොරතුරු පරීක්ෂා කරනු ලැබේ. මෙම තොරතුරු ප්‍රධාන වශයෙන් නිල ලේඛන මත පදනම් වේ. සම්මුඛ පරීක්ෂණයෙන් පසුව ඔබට ඔබගේ පුද්ගලික තොරතුරු වෙනස් කිරීමට අවශ්‍ය නම්, ඒ සඳහා විදේශ ගමන් බලපත්‍රයක් හෝ වෙනත් නිල හැඳුනුම්පතක් ඉදිරිපත් කළ යුතුය.
- ෆින්ලන්ත ආගමන සේවය ඔබගේ පුද්ගලික තොරතුරු සහ ඔබගේ අයදුම්පතේ පදනම් විදේශිකයන්ගේ කටයුතු සම්බන්ධ නිල දත්ත පද්ධතියකට ඇතුළත් කරනු ඇත. එය රාජ්‍ය නිලධාරීන් විසින් භාවිතා කරන නිල ලේඛන හා දත්ත ගබඩාවකි.
- නිලධාරියෙකුට වැරදි පුද්ගලික තොරතුරු ලබා දීම හෝ නිල දත්ත ගබඩාවකට වැරදි තොරතුරු ඇතුළත් කරවා ගැනීම අපරාධයකි. එවැනි වරදකට නීතිමය දඬුවම් පනවනු ලැබේ. ෆින්ලන්තයේ අපරාධ වගකීම වයස අවුරුදු 15 සම්පූර්ණ කළ පුද්ගලයින්ට අදාළ වේ.

## සම්මුඛ පරීක්ෂණයට පෙර මම සූදානම් විය යුත්තේ කෙසේද?

- සම්මුඛ පරීක්ෂණයේදී ඔබ ජාත්‍යන්තර ආරක්ෂාව ඉල්ලා සිටින හේතු ඔබගේම වචනවලින් පැහැදිලි කළ යුතුය. වැදගත් දිනයන් සහ පුද්ගල නාම සටහන් කර තබා ගැනීමෙන් ඔබට සම්මුඛ පරීක්ෂණයට සූදානම් විය හැක. පෙර සූදානම් වීමෙන් ඔබගේ අත්දැකීම් පැහැදිලිව විස්තර කිරීම පහසු වේ.
- ඔබ තවමත් ෆින්ලන්ත ආගමන සේවයට භාර නොදුන්, ඔබගේ අයදුම්පතට අදාළ සියලු ලේඛන සම්මුඛ පරීක්ෂණයට රැගෙන එන්න. එම ලේඛන ඔබගේ සරණාගතභාවය සඳහා වන හේතු සමඟ සම්බන්ධ වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කිරීමට සූදානම් වන්න. මෙවැනි ලේඛන අතර: හැඳුනුම්පත් සහ අනන්‍යතා ලේඛන, වෙනත් රාජ්‍ය ලේඛන, වෛද්‍ය සහතික ඔබගේ කතාවට අදාළ පුවත්පත් ලිපි සහ ප්‍රකාශන ඇතුළත් විය හැක. මෙම ලේඛන

වැදගත් වන්නේ ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා වන ඔබගේ අයදුම්පත සමඟම, වෙනත් පදනම් මත (උදාහරණයක් ලෙස විශේෂ මානුෂීය හේතු මත) නේවාසික අවසරයක් ලබා ගැනීමට ඔබට සුදුසුකම් තිබේද යන්නද ඇගයීමට ලක් කරන බැවිනි.

- සම්මුඛ පරීක්ෂණයට පෙර, ඔබට බලධාරීන් විසින් ලබා දී ඇති සියලු උපදෙස් සහ තොරතුරු පත්‍රිකා හොඳින් කියවා අවබෝධ කර ගන්න.
- නියමිත වේලාවට සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන බවට වග බලා ගන්න. එම ස්ථානයට පැමිණිය යුතු ආකාරය පිළිබඳ උපදෙස් ඔබට පිළිගැනීමේ මධ්‍යස්ථානයෙන් ලබා දෙනු ඇත. ඔබ භාරකරුවෙකු නොමැති බාලවයස්කරුවෙකු නම්, ඔබ සම්මුඛ පරීක්ෂණයට පැමිණීමේ කටයුතු පිළිගැනීමේ මධ්‍යස්ථානය විසින් සලසනු ඇත. ඔබට ෆින්ලන්තයේ භාරකරුවෙකු සිටී නම්, ඔබ සම්මුඛ පරීක්ෂණයට පැමිණීම තහවුරු කිරීම ඔහුගේ හෝ ඇයගේ වගකීමකි.
- සම්මුඛ පරීක්ෂණය පැය ගණනාවක් පුරා පැවැත්විය හැකි බව මතක තබා ගන්න. අතරමඟ දිවා ආහාර විවේකයක් සහ අවශ්‍ය නම් වෙනත් විවේක කාලද ලබා දෙනු ඇත. ඔබට ඕනෑම වේලාවක විවේකයක් ඉල්ලා සිටිය හැක. ආහාර රැගෙන එන්න හෝ දිවා ආහාරය සඳහා මුදල් රැගෙන එන්න. එසේම, දවස තුළ අවශ්‍ය විය හැකි ඖෂධ ද රැගෙන එන්න.
- දරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නොමැති නම් ඔවුන් රැගෙන ඒමට අවසර නැත. සම්මුඛ පරීක්ෂණය අතරතුර ඔබගේ දරුවා බලා ගැනීමට කෙනෙකු අවශ්‍ය නම්, ඒ පිළිබඳව ප්‍රමාණවත් කාලයකින් පෙර ඔබගේ පිළිගැනීමේ මධ්‍යස්ථානයට දැනුම් දෙන්න.
- උදාහරණයක් ලෙස ඔබගේ සෞඛ්‍ය තත්ත්වය හේතුවෙන් සම්මුඛ පරීක්ෂණය සඳහා විශේෂ අවශ්‍යතා තිබේ නම්, ඒ බව වහාම පිළිගැනීමේ මධ්‍යස්ථානයට දැනුම් දෙන්න. උදාහරණයක් ලෙස: ආබාධයක් හෝ සෞඛ්‍ය ගැටලුවක් හේතුවෙන් සහාය , මිනිස් ජාවාරමේ ගොදුරක් නම් විශේෂ සහාය ඉල්ලා සිටිය හැකිය. ඔබ භාරකරුවෙකු නොමැති බාලවයස්කරුවෙකු නම්, ඔබගේ නියෝජිතයාගෙන් සහාය ඉල්ලන්න. ඔබ රැඳවුම් මධ්‍යස්ථානයක හෝ වෙනත් ආයතනයක සිටී නම්, ඒ පිළිබඳව ඔබගේ නවාතැන් ස්ථානයේ සේවකයෙකුට දැනුම් දෙන්න. පිළිගැනීමේ මධ්‍යස්ථානය, නියෝජිතයා හෝ රැඳවුම් මධ්‍යස්ථානය සම්මුඛ පරීක්ෂණයට පෙර මේ පිළිබඳව ෆින්ලන්ත ආගමන සේවය සමඟ සම්බන්ධ විය හැක.
- ඔබට පාලනය කළ නොහැකි ස්ථිර හේතු මත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීමට හැකියාවක් නොමැති බව ෆින්ලන්ත ආගමන සේවය තීරණය කරන්නේ නම්, සම්මුඛ පරීක්ෂණය පවත්වනු නොලැබේ. එවැනි අවස්ථාවකදී ද, ඔබට අමතර තොරතුරු ලිඛිතව ෆින්ලන්ත ආගමන සේවයට ඉදිරිපත් කිරීමේ අවස්ථාව ඇත.

## සම්මුඛ පරීක්ෂණය අතරතුර සිදුවන්නේ කුමක්ද?

- ආරම්භයේදී, සම්මුඛ පරීක්ෂකයා සම්මුඛ පරීක්ෂණය අතරතුර සිදුවන දේ පැහැදිලි කරනු ඇත. මෙම උපදෙස් පත්‍රිකාවේ සඳහන් ඔබගේ අයිතිවාසිකම් සහ වගකීම් ඔබට අවබෝධ වී ඇති බව සම්මුඛ පරීක්ෂකයා තහවුරු කරනු ඇත. අවශ්‍ය නම්, ඔහු හෝ ඇය එම අයිතිවාසිකම් සහ වගකීම් නැවත ඔබට පැහැදිලි කර දෙනු ඇත. ඔබට කිසියම් කරුණක් නොතේරෙන්නේ නම්, එය අසන්න.
- සම්මුඛ පරීක්ෂකයා ඔබ සහ භාෂා පරිවර්තකයා එකිනෙකා නිවැරදිව තේරුම් ගන්නවාදැයි විමසනු ඇත. ඔබට පරිවර්තකයා පවසන දේ තේරෙන්නේ නැත්නම්, ඒ බව වහාම දැනුම් දෙන්න.

- සම්මුඛ පරීක්ෂකයා ඔබගේ සෞඛ්‍ය තත්ත්වයේ කිසියම් වෙනසක් සිදුවී ඇත්දැයි පරීක්ෂා කරනු ඇත. ඉන් අනතුරුව, ඔහු හෝ ඇය ඔබගේ පුද්ගලික තොරතුරු සමාලෝචනය කර, ඔබ සම්බන්ධ පසුබිම් තොරතුරු කිහිපයක් පිළිබඳව ප්‍රශ්න කළ හැක.
- සම්මුඛ පරීක්ෂකයා ලබා දෙන උපදෙස් හොඳින් සහ අවධානයෙන් අසන්න.



- ඊළඟට, ඔබට ඔබගේ මව්රටින් පලා යාමට සිදු වූයේ ඇයි සහ ඔබට එහි නැවත යා නොහැක්කේ ඇයි යන්න විමසා බලනු ලැබේ. සම්මුඛ පරීක්ෂකයා ජාත්‍යන්තර ආරක්ෂාව ඉල්ලා සිටින ඔබගේ හේතු නිදහසේ සහ විස්තරාත්මකව පැවසීමට ඔබව දිරිමත් කරනු ඇත. අවශ්‍ය අවස්ථාවලදී, ඔබගේ අයදුම්පතට අදාළ වැදගත් කරුණු පිළිබඳව කතා කිරීමටද ඔහු හෝ ඇය මඟ පෙන්වනු ඇත.
- ඔබ ඔබගේ අයදුම්පතේ හේතු පැහැදිලි කළ පසු, වැදගත් කරුණු සම්පූර්ණයෙන්ම පැහැදිලි කර ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂකයා ඔබෙන් අමතර සහ විස්තරාත්මක ප්‍රශ්න අසනු ඇත.
- ඔබගේ උපන් ගම, පදිංචි ප්‍රදේශය හෝ ඔබගේ නඩුව සම්බන්ධයෙන් වැදගත් වන වෙනත් කරුණු පිළිබඳවද සම්මුඛ පරීක්ෂකයා ඔබෙන් ප්‍රශ්න කළ හැක.
- ඔබට කිසියම් ප්‍රශ්නයක් තේරෙන්නේ නැත්නම්, ඒ බව සම්මුඛ පරීක්ෂකයාට පවසන්න. ඔහු හෝ ඇය එම ප්‍රශ්නය ඔබට පැහැදිලි කර දෙනු ඇත.
- සම්මුඛ පරීක්ෂණයේ කාලය වෙනස් විය හැක. සම්මුඛ පරීක්ෂණයේ ඕනෑම අවස්ථාවක ඔබට විවේකයක් ඉල්ලා සිටිය හැක.
- ඔබගේ නඩුව සම්බන්ධ තීරණයට බලපාන තොරතුරු පිළිබඳව ෆින්ලන්ත ආගමන සේවය සම්මුඛ පරීක්ෂණයේදී ඔබෙන් විමසිය හැක. උදාහරණයක් ලෙස, ඔබ ෆින්ලන්තයේ අපරාධයක් කළ බවට සැක කෙරෙන්නේ නම් හෝ ඔබ ෆින්ලන්තයේ අපරාධයකට වරදකරු වී ඇත්නම්, එය ඔබගේ නඩුව සම්බන්ධ ක්‍රියාවලියට බලපෑ හැකිය. අවශ්‍ය නම්, මේ පිළිබඳව ඔබගේ අදහස ප්‍රකාශ කිරීමට ෆින්ලන්ත ආගමන සේවය ඔබට අවස්ථාව ලබා දෙනු ඇත.

- සම්මුඛ පරීක්ෂණය පිළිබඳ නිල වාර්තාවක් සකස් කරනු ලැබේ. ෆින්ලන්ත ආගමන සේවය එය අවශ්‍ය යැයි සලකන්නේ නම්, සම්මුඛ පරීක්ෂකයා එම වාර්තාවේ කොටස් හෝ සම්පූර්ණ වාර්තාව ඔබ සමඟ පරීක්ෂා කරනු ඇත. සම්මුඛ පරීක්ෂණය අතරතුර සම්පූර්ණ වාර්තාව ඔබ සමඟ පරීක්ෂා නොකරන්නේ නම්, එයට අමතර කිරීම් හෝ නිවැරදි කිරීම් යැවිය හැකි අවසන් දිනයක් ඔබට දෙනු ලැබේ. වාර්තාවේ පිටපතක් ඔබටද ලබා දෙනු ඇත.
- සම්මුඛ පරීක්ෂණය අවසානයේදී, ෆින්ලන්ත ආගමන සේවයට අමතර ලේඛන සහ තොරතුරු යැවීම, ස්වේච්ඡාවෙන් මව්රටට ආපසු යාම සහ වෙනත් වැදගත් කරුණු පිළිබඳ වැඩිදුර තොරතුරු ලබාගත හැකි සබැඳි ඇතුළත් උපදෙස් පත්‍රිකාවක් ඔබට ලබා දෙනු ඇත. එම සබැඳි මෙම QR කේත භාවිතයෙන්ද ප්‍රවේශ විය හැක.

migri.fi/turvapaikkahakemuksen-kasittely
voluntaryreturn.fi/etusivu

- ඔබගේ අයදුම්පතට අදාළ සියලු හේතු සහ පදනම් සම්මුඛ පරීක්ෂණයේදී පැවසීම ඉතා වැදගත්ය. සම්මුඛ පරීක්ෂණයෙන් පසුව ඔබට නව හේතු මතු වුවහොත්, හෝ ඔබ කලින් ඉදිරිපත් කළ හේතුවකට අදාළ නව තොරතුරු ලබා දීමට අවශ්‍ය නම්, ඒ පිළිබඳව වහාම ෆින්ලන්ත ආගමන සේවයට හෝ ඔබගේ අභියාචනය සලකා බලන අධිකරණයට දැනුම් දෙන්න.

## සම්මුඛ පරීක්ෂණය අවසන් වූ පසු සිදුවන්නේ කුමක්ද?

- සම්මුඛ පරීක්ෂණය ඒ සඳහා වෙන් කර ඇති කාලය තුළ අවසන් කිරීමට උත්සාහ කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සම්පූර්ණ කිරීමට නොහැකි වුවහොත්, එය වෙනත් දිනයකදී නැවත පවත්වනු ලැබේ. එම අවස්ථාවේදී ඔබට නව සම්මුඛ පරීක්ෂණ කැඳවීමක් ලැබෙනු ඇත.
- ඔබගේ අයදුම්පත සම්බන්ධ අමතර ලේඛන හෝ තොරතුරු, ඔබගේ අයදුම්පතට තීරණයක් ලැබෙන තෙක් ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කළ හැකිය. කෙසේ වෙතත්, නියමිත අවසන් දිනයෙන් පසුව ඉදිරිපත් කරන ලද අමතර තොරතුරු තීරණය කිරීමේදී සැලකිල්ලට නොගනු ලැබිය හැකි බව සලකන්න. අමතර තොරතුරු ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.
- ෆින්ලන්ත ආගමන සේවය ඔබගේ අයදුම්පත සලකා බලා, ඔබට ජාත්‍යන්තර ආරක්ෂාව හෝ වෙනත් පදනමක් මත නේවාසික අවසරයක් ලබා දිය හැකිද යන්න පිළිබඳ තීරණයක් ගනු ඇත. එවැනි වෙනත් පදනම් අතර: විශේෂ මානුෂීය හේතු, මිනිස් ජාවාරමේ ගොදුරක් වීම වැනි කරුණු ඇතුළත් විය හැක.
- ෆින්ලන්ත ආගමන සේවය තීරණය ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයේදී ඔබ ලබා දුන් තොරතුරු, ඔබ ඉදිරිපත් කළ අනෙකුත් සාක්ෂි සහ ලේඛන, මෙන්ම ඔබගේ මව්රට පිළිබඳ නිල තොරතුරු මත පදනම්වය. අවශ්‍ය නම්, තීරණය සඳහා වැදගත් වන තොරතුරු පොදු මූලාශ්‍රවලින්ද සොයා බැලිය හැකිය.
- අවශ්‍ය නම්, ඔබගේ මව්රටෙන් ඔබ ඉදිරිපත් කළ ලේඛනවල සත්‍යතාව පිළිබඳ තොරතුරු ලබා ගත හැකිය. මේ සම්බන්ධයෙන් ඔබගේ මව්රටේ බලධාරීන්ට ඔබගේ අයදුම්පත පිළිබඳව දැනුම් නොදෙන අතර, මෙම පරීක්ෂණය හේතුවෙන් ඔබට හෝ ඔබගේ සමීපතමයින්ට කිසිදු අනතුරක් හෝ හානියක් සිදු නොවේ.
- ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප කළහොත්, ඔබව ෆින්ලන්තයෙන් ඉවත් කිරීමට සහ ෆින්ලන්තයට මෙන්ම අනෙකුත් ෂෙන්ගන් (Schengen) ගිවිසුම් රටවලට ඇතුළු වීම තහනම් කිරීමට තීරණය කළ හැකිය.

- සරණාගතභාවය සඳහා වන ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී, ඔබට සහාය සහිත ස්වේච්ඡා ආපසු යාම  සඳහා අයදුම් කළ හැකිය. ඔබගේ අයදුම්පත ප්‍රතික්ෂේප වුවහොත් හෝ ඔබ ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා වන අයදුම්පත ඉවත් කර ගන්නේ නම්, ස්වේච්ඡාවෙන් මව්රටට ආපසු යාම සඳහා සහාය ලබා ගැනීමට ඔබට අයිතිය ඇත. එම සහාය ලබා දීම සඳහා නිශ්චිත කොන්දේසි තිබෙන අතර, ඔබ අයදුම් කරන අවස්ථාවේදී ඒවා පරීක්ෂා කරනු ලැබේ. මේ පිළිබඳ උපදෙස් ඔබගේ පිළිගැනීමේ මධ්‍යස්ථානයෙන් ලබා ගත හැකි අතර, ෆින්ලන්ත ආගමන සේවයේ ආපසු යාම පිළිබඳ උපදේශන සේවාවේ වෙබ් අඩවියෙන්ද වැඩිදුර තොරතුරු සහ සම්බන්ධතා විස්තර ලබා ගත හැක.

**migri.fi/paluu** හෝ **voluntaryreturn.fi/etusivu**

- ඔබට තීරණයට  එරෙහිව අභියාචනයක්  ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම්, අභියාචනය සම්බන්ධ උපදෙස් එම තීරණය සමඟ අමුණා ඇති ලේඛනයේ  සොයාගත හැකිය.
- ඔබ ඔබගේ සහකරු/සහකාරිය, බාලවයස්කාර දරුවන් හෝ ඔබ මත යැපෙන වැඩිහිටි පුද්ගලයෙකු සමඟ ජාත්‍යන්තර ආරක්ෂාව  සඳහා අයදුම් කළේ නම්, සාමාන්‍යයෙන් ඔබ සැමට එකම තීරණයක් ලබා දෙනු ඇත. නමුත් ඔබගේ නඩු සඳහා වෙන වෙනම තීරණ ලබා දීමට සාධාරණ හේතුවක් ඇති බව ෆින්ලන්ත ආගමන සේවය සලකන්නේ නම්, වෙනම තීරණ ලබා දිය හැකිය. සම්මුඛ පරීක්ෂණයේදී, වෙනම තීරණ ලබා ගැනීමට ඔබට හේතු තිබේදැයි සම්මුඛ පරීක්ෂකයා ඔබෙන් විමසනු ඇත.
- පසුව ඔබට නව සරණාගතභාවය සඳහා හේතු  ඇති වුවහොත්, ඒ පිළිබඳව වහාම ෆින්ලන්ත ආගමන සේවයට හෝ ඔබගේ අභියාචනය සලකා බලන අධිකරණයට දැනුම් දෙන්න. ඔබට හැකි වූ වහාම නව කරුණු හෝ හේතු ඉදිරිපත් නොකළහොත්, එම කරුණු මත පසුව නව අයදුම්පතක් ඉදිරිපත් කළ විට ඒවා සලකා නොබැලීමට ඉඩ ඇත.